ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී පළමු වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019 පෙබරවාරි / මාර්තු

ආර්ථික විද්‍යාව

# ECON 1210.3 / 1210.03 / 1210A – සාර්ව ආර්ථික විද්‍යා මූලධර්ම

කාලය: පැය තුන (03) යි

ප්‍රශ්න පහ(05)කට පමණක් පිළිතුරු සපයන්න.

1. i) සාර්ව ආර්ථික විද්‍යාව යනු කුමක් ද? (ලකුණු 02)

   ii) සාර්ව ආර්ථික විද්‍යාවේ වැදගත්කම කුමක් ද? (ලකුණු 04)

   iii) සාර්ව ආර්ථික අරමුණු නම්කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

2. i) දළ දේශීය නිෂ්පාදිතය යනු කුමක් ද? එය ජාතික ආදායමින් වෙනස්වන්නේ කෙසේද? (ලකුණු 04)

   ii) ජාතික ආදායම හා කුටුම්භ ආදායම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 06)

   iii) සරල ආර්ථිකයක ආදායමේ වෘත්තාකාර ප්‍රවාහය පැහැදිලි කරන්න. (ලකුණු 06)

3. කල්පිත ආර්ථිකයක පරිභෝජනයට අදාළ දත්ත කිහිපයක් පහත දැක්වේ (සංඛ්‍යා රුපියල් මිලියනවලිනි).

| Yd | C |
|---|---|
| 1000 | 900 |
| 3000 | 2500 |

   i). මෙම ආර්ථිකය සඳහා පාරිභෝජන ශ්‍රිතය හා ඉතුරුම් ශ්‍රිතය ගොඩනගන්න. (ලකුණු 06)

   ii). $I = 100, G = 50, NT = 25$ නම් මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම කොපමණද? (ලකුණු 04)

   iii). "සමතුලිත ජාතික ආදායම් මට්ටම පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම් මට්ටමට සමාන වීම අනිවාර්ය නොවේ" මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 06)

4. i) මුදල්වල කාර්යයන් මොනවාද? (ලකුණු 04)

ii) මුදල්වල කාර්යයන් ඉටුකිරීමේ දී සීඝ්‍ර උද්ධමනය කුමන බලපෑම් ඇති කරන්නේද? (ලකුණු 06)

iii) මුදල් මැවීමේ ක්‍රියාවලිය කල්පිත උදාහරණයක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

5. i) උද්ධමනකාරී තත්ත්වයක් ඇතිවීමට බලපාන සාධක මොනවාද? (ලකුණු 08)

ii) උද්ධමනයක් ආර්ථිකයේ විවිධ සාර්ව ආර්ථික විචල්‍යයන්ට කළ හැකි බලපෑම කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

6. i) මුදල් සැපයුමේ (M4) සහ මුදල් පදනමේ සංයුතිය පැහැදිලි කොට මුදල් ගුණකය ගොඩනගන්න. (ලකුණු 10)

ii) "පොලී අනුපාතයේ ඉහළයාමක් මුදල් ඉල්ලුම අඩුවීමට හේතු වේ" පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii) මහ බැංකුවේ අරමුණු මොනවාද? (ලකුණු 02)

7. පහත සංකල්පවලින් හතරක් විස්තර කරන්න.
   i). ඒක පුද්ගල ආදායම
   ii). පිලිප්ස් වක්‍රය
   iii). ස්වභාවික සේවා වියුක්තිය
   iv). ජාතික ගිණුම් අස්තමේන්තුවල මිල සංකල්පය
   v). ගොවුම් ශේෂ ලේඛනය

(එක් කොටසකට ලකුණු 04)

**********